**12-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම ඉගෙනුම ඔබගේ ආදායම් මාර්ගයයි. මෙමගින් ඔබ උපත් 21 කට සෑහෙන ආදායමක් උපයා ගෙන මානවයෙකුගෙන් දේවතාවරයෙක් බවට පත්වේ.

**ප්‍රශ්නය:** පරමාත්ම පියා විසින් ඔබට කියා දෙන මිහිරි දේ ඔබ ධාරණය කර ගන්නේ කවදාටද?

**පිළිතුර:** ඔබගේ බුද්ධිය තමාගේමත් අන් අයගේත් මත අදහස්වල බලපෑමෙන් මිදුණුදාට ඔබට මේවා හොඳින් ධාරණය කරගත හැකිවේ. ඕපාදූප කටකථා මත පදනම්ව සෑම දෙයක්ම කරනා දරුවන්ට කිසිම දෙයක් ධාරණය කරගත නොහැකිවේ. කවුරු හෝ කෙනෙක් ඥාන කරුණු වලට අමතර වෙනත් යමක් ඔබට කීවොත් ඒ පුද්ගලයා ඔබගේ සතුරෙක් මෙනි. බොරු කියනා අය විශාල ප්‍රමාණයක් සිටිනවා. එමනිසා නරක දේට ඇහුම් කන් දෙන්න එපා. නරක දේ දකින්න එපා. මානවයෙකුගෙන් දේවතාවරයෙක් වීමට නම් එකම එක පරමාත්ම පියාගේ ශ්‍රීමත් පිළිපදින්න.

**ගීතය:** අපගේ වන්දනා ගමන අසහායයි.

ඕම් ශාන්ති. මෙම ගීතයේදී ඔබ ඔබගේම ගුණ වර්ණනාව ගයනවා වාගේයි. ඇත්තටම කියනවා නම් කෙනෙකුට තමාවම වර්ණනා කර ගත නොහැකියි. මේ කරුණු සියල්ලක්ම අවබෝධ කර ගත යුතුයි. ඉතාමත් ඥානවන්තව සිටි භාරත වැසියන් දැන් අඥානයින් වෙලා. දැන් පැන නගින ප්‍රශ්නය නම්: ඥානවන්තව සිටියේ කවුද? මෙය කිසිම තැනක සඳහන් කර නැහැ. ඔබලා අදෘශ්‍යමානයි. මේවා එතරම් අරුම පුදුම කරුණුයි. පරමාත්ම පියා කියනවා: දරුවන්ට මාව අවබෝධ කර ගත හැක්කේ මාගෙන්ම පමණයි: පසුව ඔවුන් අන් සියල්ලක්ම මගෙන් දැන ගත හැකියි. ලෝකයේ ආරම්භයේ පටන් අවසානය දක්වාම වන සිදුවනදේ ඔවුන්ට අවබෝධ කර ගත හැකියි. වෙන කිසිම කෙනෙක් මේවා දන්නේ නැහැ. ඔවුන් ප්‍රධාන වැරැද්දක් කර තිබෙනවා. ඒ තමයි පරමාත්ම පියා පරමාත්ම ජීවය වන ශිවා යන නම වෙනුවට ඔවුන් ක්‍රිෂ්ණගේ නම යොදා තිබෙනවා. ශ්‍රීමත් භගවත් ගීතාව කියා හඳුන්වන අංක එකේ ග්‍රන්ථය වැරදීමක් වෙලා. එමනිසා, පළමුවෙන්ම දෙවියන් එක් අයෙක් බව ඔප්පු කරන්න. පසුව ඔවුන්ගෙන් අහන්න ගීතාවේ දෙවියන් කවුදැයි කියලා. භාරතයේ ආදි සනාතන දේවි දේවතා ධර්මය තිබෙනවා. අළුත් ආගමක් ගැන කතා කළහොත් ඒ බ්‍රහමින් ධර්මය ගැනයි. පළමුවෙන්ම ඉහළින්ම සිටිනා බ්‍රහමින්වරුන් සිටිනා අතර පසුව දේවතාවරුන් සිටිනවා. ඉහළම ඉහළ වන්නේ බ්‍රහමින් ධර්මයයි. පරමාත්ම පරම පිතා බ්‍රහ්මා හරහා නිර්මාණය කරනා බ්‍රහමින්වරුන් පමණයි පසුව දේවතාවරුන් වන බ්‍රාහ්මණයින් වන්නේ. ප්‍රධානම දෙය වන්නේ සෑම කෙනෙකුගේම පියා පරමාත්මය යන්නයි: නව ලෝකයේ නිර්මාණකරු ඔහුයි. ඔහු අනිවාර්යෙන්ම අළුත් ලෝකයක් නිර්මාණය කරනවා. නව ලෝකයේ නව භාරතයක් තිබෙනවා. ඔහු ඉපදී තිබෙන්නේ භාරතයේයි. ඔහු බ්‍රහ්මා හරහා භාරතය දෙව්ලොව බවට පත් කරවනවා. ඔහු ඔබව තමාට අයිති කරවා ගෙන මානව බවින් දේවතාවරුන් වීමට ඔබට උගන්වනවා. මීට පෙර ඔබ අයිතිව සිටියේ ශුද්‍ර සමාජයටයි දැන් ඔබ බ්‍රාහ්මන කුළයට පැමිණ පසුව දේවතා කුළයට යනු ඇත. පසුව එන්න එන්නම ජනගහනය වර්ධනය වී එක් ධර්මයකින් තවත් ධර්ම ගණනාවක් මතු විය හැකියි. සෑම ධර්මයකින්ම තවමත් අතු රිකිලි මතු වෙමින් පවතිනවා. ප්‍රධාන ශාඛා තුනක් තිබෙනවා: ප්‍රධානම දෙය මෙයයි. ඒ ඒ අයගෙන් ඔවුනොවුන්ගේ ශාඛා මතුවෙනවා. ප්‍රධානම දෙය පදනම වන අතර පසුව ප්‍රධාන අතු තුනක් පිහිටනවා. කඳ වන්නේ දැන් සෑම කෙනෙක්ම රාජයෝගාව හදාරන ආදි සනාතන දේවි දේවතා ධර්මයයි. දිල්වාලා දේවාලය හොඳින් සාදා තිබෙනවා. මුළු පැහැදිලි කිරීමම එහි අන්තර්ගතයි. මීට පෙර කල්පයේදීත් ඔබ විසින් කළ රාජයෝග තපස්දම කළ මෙම භූමියේ ඔබ අසුන් ගෙන සිටිනවා. ක්‍රිස්තියානි රට වල ක්‍රිස්තුන්ගේ සිහිවටන තිබෙන්නාක් සේ ඔය දරුවනුත් තපස්දම කළේ මෙහි වන නිසා මෙහි ඔබගේ සිහිවටන සාදා තිබෙනවා. මෙය තේරුම් ගැනීම ඉතාමත් පහසු කරුණක් වුවත් කවුරුත් එය දන්නේ නැහැ. සන්නාසීවරුන් කියන්නේ සෑම දෙයක්ම හිතළු කියලයි. නැතිනම් එකිනෙකා සිතාගෙන සිටිනා දේවල් කියලයි. මේ පින්තූර සෑම එකක්මත් ඔබ සාදා ඇත්තේ හිතට එන එන දේවල් වලින් කියාත් ඔවුන් කියනවා. පරමාත්ම පියාව දැන ගන්නා තෙක් ඔවුන් ඒ සෑම දෙයක්ම සලකන්නේ හිතළු කියලයි. එකම එක පරමාත්ම පියා පමණයි ඥානයෙන් පිරි කෙනා. ඉතින් ප්‍රධානම දෙය පරමාත්ම පියාගේ හැඳින්වීම දීමයි. පරමාත්ම පියා දෙව්ලොව උරුමය උරුම කර දෙනවා. මීට පෙර කල්පයේදීත් ඔහු

එය ඔබට දුන්නා. පසුව ඔබට උපත් 84 ක් ගැනීමට සිදු වුණා. භාරත වාසීන් පමණයි උපත් 84 ක් ගන්නේ. පසුව සංගම යුගයේදී පරමාත්ම පියා පැමිණ අධිරාජ්‍යය ස්ථාපනය කරනවා. ඔය දරුවන් මෙය පරමාත්ම පියාගෙන් තේරුම් ගෙන තිබෙනවා. මේ සියල්ල ඉතාමත් හොඳින් තේරුම් ගෙන තම බුද්ධියේ හොඳින් තැන්පත් කර ගත් විට ඒ සතුට ඔබට දැනේවි. මෙම ඥානය මහා විශාල ආදායම් මාර්ගයකි. මිනිසුන් නීතිඥයින් වැනි අය බවට පත් වන්නේ ඒ අධ්‍යාපනය හදාරායි. කෙසේවෙතත්, මෙම ඥානය ඇත්තේ මනුෂ්‍යයෙකුගෙන් දේවතාවරයින් වීමටයි. ලැබීම ඉතාමත් ඉහළයි. එතරම් දෙයක් ලබා ගැනීමට වෙන කිසිම කෙනෙකුට ඔබව දිරිමත් කරවිය නොහැකියි. සීක් ග්‍රන්ථයේ පවා සඳහන් වී තිබෙන්නේ: මිනිසුන් දේවතාවරුන් කරවීමට දෙවියන්ට එතරම් කාලයක් ගත වුණේ නැති බවයි. කෙසේවෙතත් මිනිසුන්ගේ බුද්ධිය වැඩ කරන්නේ නැහැ. ඒ දේවතා ධර්මය අනිවාර්යයෙන්ම දැන් අතුරුදන් වෙලා. මෙන්න මේ නිසා තමයි මිනිසුන් දේවතාවරුන් වුණු බව සඳහන් වී ඇත්තේ. දේවතාවරුන් සිටියේ ස්වර්ණමය යුගයේයි. දෙවියන් අනිවාර්යයෙන්ම ඔවුන්ව ඒ තත්ත්වයට පත් කරවන්න ඇත්තේ සංගම යුගයේදියි. ඔහු ඔවුන්ව එසේ නිර්මාණය කරන්නේ කෙසේදැයි කියා ඔවුන්ට තේරෙන්නේ නැහැ. ගුරු නානක් පවා දේව ප්‍රශංසා ගී ගැයුවා. ඔහු ගැයූ තරම් ගීත වෙනත් කිසිවෙක් විසින් ගයා නැහැ. මෙන්න මේ නිසා තමයි භාරතයේ ජනතාව ග්‍රාන්තය කියවන්නේ. ගුරුනානක් පැමිණෙන්නේ කලියුගයේදීයි. ඔහු ඒ ධර්මයේ ප්‍රමුඛයායි. පසුව එය රාජධානියක් වුණා. පරමාත්ම පියා දේවතා ධර්මය ස්ථාපනය කළා. ඇත්තෙන්ම කියනවා නම්, නව ලෝකය කියා කියන්න පුළුවන් බ්‍රහමින්වරුන්ගේ පමණයි. ඉහළින්ම සිටින්නේ බ්‍රහමින්වරුන් වුවත්, රාජධානිය ඇරඹෙන්නේ දේවතාවරුන්ගෙනි. ඔය බ්‍රහමින්වරුන් නිර්මාණය වී තිබෙනවා. ඔබගේ මෙය රාජධානියක් නොවෙයි. ඔබම තමා වෙනුවෙන් රජ දහනක් නිර්මාණය කර ගන්නවා. මේවා හරිම අරුම පුදුම කරුණුයි. මිනිස්සු කිසිම දෙයක් දන්නේ නැහැ. ඔබ යමක් පළමුව අවබෝධ කරගත් විට අන් අයටත් එය ඔබගෙන් ඉගෙන ගත හැකියි. ඔබලා ශුද්‍රයින්ගෙන් බ්‍රහමින්වරුන් බවට පත් වෙලා. බ්‍රහ්මා පවා මෙය දැන් දැන ගත්තේ පරමාත්ම පියාගෙනුයි. ඔහු සියල්ලම මොහුට පහදා කියනවා. එමනිසා මොහුත් ඒවා අනිත් දරුවන්ට පැහැදිලි කළ යුතුයි. ඔහු මෙහි සිට මොහුගේ ශරීරය හරහා ඔය දරුවන්ට පැහැදිලි කර කියා දෙනවා. මේවා අත්දැකිය යුතු කරුණුයි. කිසිම කෙනෙකුට ග්‍රන්ථයකින් කිසිම දෙයක් තේරුම් ගත නොහැකියි. පරමාත්ම පියා කියනවා: මේ ලෙසින් ඔබට පැහැදිලි කිරීමට මා පැමිණෙන්නේ මුළු කල්පයටම එකම එක වතාවයි. ඒකායන ධර්මය ස්ථාපනය කර මම අසංඛ්‍ය වූ ආගම් සියල්ල විනාශ කර දමනවා. මෙය වසර 5000 ක සෙල්ලමක්. තමන් දැන් උපත් 84 ක් ගෙන ඇති බව ඔය දරුවන් දන්නවා. විෂ්ණු ගේ පෙකණිය අග සිටිනා බ්‍රහ්මාව ඔවුන් පෙනවනවා. බ්‍රහ්ම හා විෂ්ණු කාගේ දරුවන්ද? දෙදෙනාම ශිවාගේ දරුවනුයි. ඔහු නිර්මාණකරු වන අතර මොවුන් නිර්මාණය වෙනවා. කිසිම කෙනෙකුට මේ දේවල් තේරුම් ගන්න බැහැ. මේවා මුළුමනින්ම අළුත් කරුණුයි. බාබාම පවා කියන්නේ මේවා අළුත් දේවල් කියලායි. මේවා ග්‍රන්ථ වල තිබිය නොහැකියි. පරමාත්ම පියා ඥාන සාගරයයි. ඔහු ගීතාවේ දෙවියනුයි. භක්ති මාර්ගයේදී මිනිස්සු ශිව ජයන්තිය සමරනවා. ස්වර්ණමය හෝ රිදී යුග වලදී එය සමරන්නේ නැහැ. එමනිසා ඔහු අනිවාර්යයෙන්ම පැමිණෙන්න ඇත්තේ සංගම යුගයේදීයි. ඔබ මේ දේවල් හොඳින් තේරුම් ගෙන අන් අයටත් පැහැදිලි කර කියා දෙනවා. පරමාත්ම පියා විසින් ඔබට පැහැදිලි කර කියා දෙනවා. පරමාත්ම පියා විසින් ඔබට පැහැදිලි කළ ප්‍රශංසාව කුමක් වුවත් එය ඔය දරුවන්ගේත් ප්‍රසංසාව විය යුතුයි. ඔබලාත් ඥාන සාගර බවට පත් විය යුතුයි. සෙනෙහසේ සාගර, සතුටේ සාගර බවට ඔබලා පත්විය යුත්තේ මෙහිදීයි. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. ඉතාමත් මිහිරි වන්න. වස සේ තිත්තවට සිටි ඔබලා දැන් පාපයෙන් තොර බහමින්වරුන් වෙමින් සිටිනවා. ඔබලා දේව දරුවන් බවට පත්ව සිටිනවා. පාපකාරි මිනිසුන් වන ඔබලා පාපයෙන් තොර දේවතාවරුන් වෙමින් සිටිනවා. කල්ප භාගයක් පුරාවටම අපිරිසිදුව සිටි ඔබලා දැන් අන්ත පරිහානියකට ඇද වැටිලා. දිරාපත් වුණු පැරණි ඇඳුම් සෝදන විට ගලේ ගැහුවොත් ඉරිලම යනවා. මෙහිදීත් ජීවාත්මයන්ව ඥාන ගලේ ගැසුවහොත් ඔවුන්ව කෑලි කෑලි වලට කැඩී යනවා. ඇතැම් ඇඳුම් කිලුටුම කිලුටු නිසා පිරිසිදු කිරීමට සෑහෙන කාලයක් ගත වෙනවා. එවිට ඔවුන්ට එහිදී හිමි වන්නේ පහත් තත්ත්වයකි. බාබා තමයි රෙදි අපුල්ලන්නා ඔබලා ඔහුගේ අත් උදව්කරුවනුයි. රෙදි අපුල්ලනුත් එක් එක් මට්ටමේ අය සිටිනවා. මෙහිදී ඔබත් එක් එක් මට්ටමින් සිටිනවා. රෙදි අපුල්ලන්නෙක් හොඳින් රෙදි සේදුවේ නැතිනම්, ඔහු මේ ලඟදී රෙදි සේදීමට ඉගෙන ගත් බාබර් කෙකේ වගේ කියා කියනවාලු. ඒ දවස් වල කිලිටි රෙදි බොහෝමයක් ගම්මාන වල සේදුවා. මේ පුරුද්ද ගෙන තිබෙන්නේ පිටරැටියන්ගෙන් විදේශිකයන් පොඩි ගෞරවයක් දී මුදල් ටිකකුත් දෙනවා. ඉතාමත් ඉහළ කුළයක සිටි ඔබලා (භාරතය) දැන් ඇද වැටුණු අය බව ඔවුන් දන්නවා. වැටුණු අය කෙරෙහි අනුකම්පා දක්වනවා. පරමාත්ම පියා කියනවා: මම ඔබව ඉතාමත් ධනවත් කෙරෙව්වා. දැන් බලන්න මායා ඔබව පත් කර ඇති තත්ත්වය දිහා.

තමන් ජයග්‍රාහී මාලාවේ සිටි බව ඔබලා දන්නවා. නමුත් උපත් 84 ක් ගෙන පැමිණ දැන් ඇවිත් ඉන්නේ කොතනටදැයි කියා බලන්න. ඒක පුදුමයක්. භාරතයේ අය දෙව්ලොව වාසීන්ව සිටි බව ඔවුන්ට පහදා කියා දිය හැකියි. භාරතය දිව්‍ය ලෝකය වී තිබුණා. පසුව බිම ඇද වැටීමෙන් ඔවුන්ට අපායේ වැසියන් වීමට සිදු වුණා. පරමාත්ම පියා දැන් කියන්නේ: පාරිශුද්ධ වී දෙව්ලොව වාසීන් වන්න. මන්මනාභව, ශිව පරමාත්මය කියනවා: නිරන්තරයෙන් මා පමණක් සිහිකරන්න. ඔබගේ සෑම පාපයක්ම ස්මරණ වන්දනාවෙන් දුරු වී යාවි. රැජිණියන් කරවීමට ක්‍රිෂ්ණා කාන්තාවන්ව පැහැර ගත්තායි කියා පොත් වල ලියා තිබෙනවා. ඔබ සෑම කෙනෙක්ම හොඳින් ඉගෙන ගෙන රැජිණියන් වෙනවා. කෙසේවෙතත්, කිසිම කෙනෙකුට මේ දේවල් තේරෙන්නේ නැහැ. පරමාතේම පියා පැමිණ දැන් ඔය දරුවන්ට කරුණු පහදා කියා දුන්නා. පරමාත්ම පියා කියනවා: මම සෑම කල්පයකදීම ඔබට පැහැදිලි කිරීමට පැමිණෙනවා. එමනිසා, ඒකායන දෙවියන් පිළිබඳව පළමුව ඔප්පු කර පෙන්වා දී පසුව ගීතාවේ දෙවියන් කවුදැයි යන්න කියා දෙන්න. රාජයෝගාව ඉගැන්වූයේ කවුද? බ්‍රහ්මා හරහා ස්ථාපනය කළේ දෙවියනුයි. පසුව විනාශය හා පෝෂණයත් දුන්නේ ඔහුමයි. ඔය බ්‍රහමින්වරුන් පසුව දේවතාවරුන් වෙනවා. මීට පෙර කල්පයේදීත් මේ දේවල් තේරුම් ගත් අය පමණයි මේවා තේරුම් ගන්නේ. තත්පරයක් තත්පරයක් පාසා මේ වන තෙක් සිදු වුණු සෑම දෙයක්ම ඔවුන් තේරුම් ගනීවි. නාටකයේ ඔබ ලොකු උත්සාහයක් දැරිය යුතුයි. තමන් තවමත් හරි තත්ත්වයකට පත්ව නොමැති බවත් එයට කාලයක් ගත වන බවත් ඔය දරුවන්ට තේරෙනවා. කර්මතීත් තත්ත්වයට ඔබ ළඟා වී ඔබ සෑම කෙනෙක්ම අංක එකින් සමත් වුණු විට යුද්ධය ඇරඹේවි. එකිනෙකා අතර නොනවතින ගැටුම් ඇති වේවි. ඔවුන් සෑම තැනකම සූදානම් වෙමින් සිටිනවා. දිව්‍යමය දර්ශන වලින් දුටු සෑම දෙයක්ම ඔබට පියවි ඇසින් දැක ගත හැකි වේවි. ස්ථාපනය පිළිබඳව දුටු ඔබලා පසුව රාජධානියත් හැබෑහින්ම දකීවි. ඔය දරුවන් ලොකු සතුටකින් සිටිය යුතුයි. ඒවා මහළු ශරීරයි. ඔය ජීවාත්මයන් යෝග බලයෙන් පාරිශුද්ධ වුණු පසු ඒ පැරණි ශරීර අතහැර දමා යාවි. උපත් 84 චක්‍රය දැන් අවසන් වෙමින් පවතිනවා. එතැනින් ඔබ අලුත් ශරීර ගනු ඇත. මේවා තේරුම් ගැනීමට ඉතාමත් පහසු කරුණුයි. කලි යුගයට පසුව අනිවාර්යෙන්ම ස්වර්ණමය යුගය පැමිණෙක බව ඔබට පැහැදිලි කර කියා දිය හැකියි. අනන්ත වූ ආගම් සියල්ල අනිවාර්යෙන්ම විනාශ විය යුතුයි. ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය කිරීමට පරමාත්ම පියා පැමිණේවි. ඔබලා දැන් දේවතාවරුන් වීමට බ්‍රහමින්වරුන් වී සිටිනවා. ඒ වෙනත් කවුරුවත් විය නොහැකියි. ඔබලා දැන් ශිව බාබාට අයිති අය බව ඔබලා දන්නවා. ශිව බාබා ඔබට ඔබගේ උරුමය දිනා දෙනවා. ශිව ජයන්තිය යනු භාරතය උරුමය ලැබීමයි. ශිව බාබා පැමිණියා. නමුත් ඒ පැමිණ ඔහු කළේ කුමක්ද ? ඉස්ලාම්වරුන් හා බෞද්ධයින් පැමිණ ඒ ඒ ධර්මය ස්ථාපනය කළා. පරමාත්ම පියා පැමිණ කළේ කුමක්ද? ඔහු අනිවාර්යෙන්ම දෙව්ලොව ස්ථාපනය කළා. ස්ථාපනය සිදුවූයේ කෙසේද? එය සිදුවන්නේ කෙසේද යන්න ඔබට තේරෙනවා. පසුව ස්වර්ණමය යුගයේදී ඔබට සියල්ල අමතක වේවි. තමන් උපත් 21 කට උරුමය දිනමින් සිටිනා බවත් ඔබට තේරෙනවා. මෙය නාටකයේ නියමිතයි. එක් අයෙක් පියා වන අතර අනිත් කෙනා දරුවා වන බවත් දරුවා විසින් උරුමය දිනා ගත යුතු බවත්. එය මේ කාලයේ දෙයක් බවත් ඔවුන් තේරුම් ගන්නා එකක් නැහැ. ඔබලා උපත් 21 කට සෑබෑම ආදායමක් මෙහිදී උපයාගෙන තම උරුමය දිනා ගන්නවා. ඔබ උපත් 84 ක් ගත යුතුයි. සතෝ ප්‍රධාන් තත්ත්වයෙන් ඔබ සතෝ, රජෝ හා තමෝ මට්ටම් පසු කර යායුතුයි. මෙය හොඳින් සිහි කර ගැනීමෙන් ඔබට ඒ සතුටත් දැනේවි. පැහැදිලි කිරීමට ලොකු උත්සාහයක් අවශ්‍යයි. සියල්ල අවබෝධ කර ගත් විට ඔවුන්ට මහත් සතුටක් දැනේවි. සියල්ල හොඳින් අවබෝධ කර ගන්නා දරුවන්ට පසුව තවත් බොහෝ පිරිසකට පැහැදිලි කර කියා දිය හැකියි. ඔවුන් නොවරදවාම අන් අයව කටු බවින් මල් කරවනවා. මෙය අසීමිත නාටකයක්. ඔබලාත් අසීමිත උරුමයක් ලබනවා. මෙහි අසීමිත අත්හැරීමකුත් තිබෙනවා. නිවසේ ජීවත් වන ගමන් මුලු පවුලම අත්හළ යුතුයි. මන්ද මෙම පැරණි ලෝකය විනාශ වීමටයි යන්නේ කියා ඔබට තේරෙනවා. ඔබ දැන් නව ලෝකයට යා යුතුයි. මෙන්න මේ නිසා තමයි ඔබට අසීමිත නිරාශාවක් තිබා ගන්නැයි කියන්නේ. සන්නාසීවරුන්ට ඇත්තේ සීමිත නිරාශාවක් මන්ද එය හතා යෝගාවයි. මෙහිදී කිසිම බලපෑමක් පිළිබඳ කරුණක් නැහැ. මෙය ඉගෙනීමක්. ඔබලා මෙම පාසලේ දී ඉගෙන ගන්නේ මානවයින් ගෙන් දේවතාවරුන් වීමටයි. මේවා දෙවියන්ගේ කියමනුයි: ඒවා ක්‍රිෂ්ණා කියූ දේ විය නොහැකියි. ක්‍රිෂ්ණාට කවදාවත් නව ලෝකයක් ස්ථාපනය කරන්න බැහැ. ඔහුට දෙව්ලොව දෙවි පියාණන් කියා කියන්න බැහැ. ඔහුට කියන්නේ දෙව්ලොව රජ කුමරා කියලායි. එමනිසා මේවා ඔබ විසින් අවබෝධ කර ගෙන ධාරණය කර ගත යුතු ඉතාමත් සරළ මිහිරි කරුණුයි. දිව්‍යමය චරිතයකුත් අවශ්‍යයි. කටකතා වලට ඇහුම් කන් දීමවත් ඒ මත ක්‍රියා කිරීමවත් කිසිවිටෙක නොකරන්න. ව්‍යාස කියූ දේ අසා ඔබට වී ඇති තත්ත්වය දෙස බලන්න. කවුරු හෝ කෙනෙක් ඥානයට අමතර දෙයක් ඔබට කිවහොත් ඔහු ඔබගේ සතුරා බව තේරුම් ගන්න: ඔහු

ඔබව පරිහාණියට ඇද දමාවි. කිසිදු විටෙක අන් අයගේ මත වලට ඇහුම් කන් නොදෙන්න. ඔබගේම හෝ අන් අයගේ මත අදහස් පිළිපැද්දොත් ඔබ මිය යාවි. පරමාත්ම පියා පහදා කියනවා: බොරු කියනා අය බොහෝමයක් සිටිනවා. පරමාත්ම පියාටම පමණක් ඇහුම් කන් දෙන්න. නරක දේ අහන්න එපා. නරක දේ දකින්න එපා. බාප්දාදා පැමිණ සිටින්නේ මිනිසුන්ව දේවතාවරුන් කරවීමටයි. එමනිසා, ඔහුගේ ශ්‍රීමත් පිළිපදින්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැතිවී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියා ගෙන් අධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරමාත්ම පියා සේම මෙහිදී සතුටේ සාගරයක් හා සෙනෙහසේ සාගරයක් වන්න. සෑම ගුණධර්මයක්ම ධාරණය කර ගන්න. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා.
2. ඔබට ඇහෙන කටකතා විශ්වාස කරන්න එපා. අන් අයගේ මත අදහස් පිළිපදින්න එපා. නරක දේ අහන්න එපා. නරක දේ දකින්න එපා.

**වරදානය:** ඔබ මාස්ටර් සහ දරුවෙකු වී "මම" යන ඕනෑම අවධානයෙ බර අවසන් කර එමගින් ක්ෂණික ඵල අත්විඳිත්වා.

ඔබට "මම" යන ඕනෑම ආකාරයක අවධානයක් ඇති විට, ඔබේ හිස මත බරක් ඇත. කෙසේ වෙතත්, පරමාත්ම පියා ඔබේ සියලු බර ගැනීමට ඉදිරිපත් වන විට, ඔබට සරලව නටන්නට සහ පියාසර කිරීමට හැකි වන පරිදි, ඔබ ප්‍රශ්න කරන්නේ ඇයි: "සේවය සිදුවන්නේ කෙසේද? කතා දෙන්නේ කෙසේද?" ඔබ උපකරණයක් ලෙස සලකන්න, බලාගාරයට සම්බන්ධ වී වාඩි වන්න. අධෛර්යමත් නොවන්න, මන්ද බාප්දාදා ස්වයංක්‍රීයව සියල්ල සිදුවීමට ඉඩ සලසයි. ඔබ දරුවෙකු සහ මාස්ටර් ලෙස සලකා ඔබේ උසස් අවධියේ ස්ථාවරව සිටින්න, එවිට ඔබ ක්ෂණික ඵල අත්විඳිනු ඇත.

**පාඨය:** මෙම ඥානය පරිත්‍යාග කිරීමත් සමඟම, ගුණධර්ම ද පරිත්‍යාග කරන්න, එවිට ඔබට සාර්ථකත්වය දිගටම ලැබෙනු ඇත.

***** ඕම් ශාන්ති *****

අව්‍යක්ත් සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.

සිදුවීම් කොතරම් දරුණු වුවත්, එය ක්‍රීඩාවක් ලෙස සැලකීමෙන්, එම දරුණු සිදුවීම පවා සැහැල්ලු වනු ඇත. සමහර දරුවන්ට ධෛර්යයක් තියෙනවා, යමක් සිදුවුවහොත්, ඔවුන් කියනවා, "ඔව්, මම ඒක කරන්නම්. මම ඒ ගැන හිතන්නම්." ඔවුන්ට ධෛර්යයක් තියෙනවා, නමුත් ඔවුන්ට විශ්වාසයක් නැහැ. ඒවා විශ්වාසවන්ත කෙනෙකුගේ වචන නොවේ. විශ්වාසවන්ත කියන්නේ ඔබේ සිතුවිලි, වචන සහ ක්‍රියා කෙරෙහි ඔබේ බුද්ධියට ශ්‍රද්ධා විශ්වාසයක් තියෙනවා කියන එකයි. යමෙකුගේ ධෛර්යය නැති කරන කිසිවක් ඔබ කිසි විටෙකත් නොකියනු ඇත.